# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1981 අංක 10 දරන
# මහ නගර සභා සහ නගර සභා
# (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1981 පෙබරවාරි මස 27 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1081 මාර්තු මස 06 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : ශත 35 යි

තැපැල් ගාස්තුව : ශත 50 යි

# 1981 අංක 10 දරන මහ නගර සභා සහ නගර සභා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1981 පෙබරවාරි මස 27 වන දින]

එල්. ඩී.—ඕ. 37/79

**මහ නගර සභා ආඥාපනත සහ නගර සභා ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1981 අංක 10 දරන මහ නගර සභා සහ නගර සභා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන යම් දිනයක සිට එය ක්‍රියාත්මක විය යුතු ය. කෙටි නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය.

## I වන කොටස

## මහ නගර සභා ආඥාපනත සංශෝධනය කිරීම

2. 1967 අංක 8 හා 1979 අංක 57 දරන පනත් මගින් සංශෝධිත මහ නගර සභා ආඥාපනතේ 230 වන වගන්තියේ (1අ) උප වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් උපවගන්ති ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :— මහ නගර සභා ආඥාපනතේ 230 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(1අඅ) වෙළෙඳ හෝ වාණිජ කාර්ය සඳහා පාවිච්චි කරනු ලබන ස්ථානයක් සඳහා වැඩි වරිපනම් බදු ප්‍රමාණයක්, (1) වන උපවගන්තිය යටතේ වූ බලතල ප්‍රකාර, සභාව විසින් පැනවිය හැකි ය.

(1අආ) (අ) සභාව විසින් (ආ) ඡේදය යටතේ තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයක් නොඉක්මවන වාර්ෂික වටිනාකමක් ඇති සියලු නේවාසික ස්ථාන සභාව විසින්, අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව වරිපනම් ගෙවීමෙන් නිදහස් කළ හැකි ය.

(ආ) නිදහස් කරනු ලැබිය හැකි නේවාසික ස්ථානවල වාර්ෂික වටිනාකමේ ප්‍රමාණය තීරණය කිරීමේ දී සභාව විසින්—

(i) මහා නාගරිකයේ සංවර්ධන තත්ත්වය ;

(ii) වඩා අඩු වාර්ෂික වටිනාකමක් ඇති නේවාසික ස්ථානවලට සභාව මගින් සලසන සේවාවල හා පහසුකම්වල ස්වභාවය ;

(iii) යම් නිදහස් කිරීමක් දීමේ හේතුවෙන් සිදුවිය හැකි ආදායම අඩුවීම හා ඒ අඩුව පියවා ගැනීම සඳහා සභාව විසින් යෝජනා කරනු ලබන ක්‍රියා මාර්ග

සැලකිල්ලට ගත යුතු ය.

(ඇ) (ආ) ඡේදයේ විධිවිධාන යටතේ යම් නේවාසික ස්ථානයක් නිදහස් කරනු ලැබූ විට, එකී නිදහස් කරනු ලැබීමේ වාසිය එහි පදිංචිකරුට උපචිත විය යුතු ය.".

2—ජ 54231—11250 (80/12)

## II වන කොටස

### නගර සභා ආඥාපනත සංශෝධනය කිරීම

නගර සභා ආඥාපනතේ 160 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. නගර සභා ආඥාපනතේ 160 වන වගන්තිය, එම වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උප වගන්ති ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(1අ) වෙළෙඳ හෝ වාණිජ කාර්ය සඳහා පාවිච්චි කරනු ලබන ස්ථානයක් සඳහා වැඩි වරිපනම් බදු ප්‍රමාණයක, (1) වන උපවගන්තිය යටතේ වූ බලතල ප්‍රකාර, සභාව විසින් පැනවිය හැකි ය.

(1අඅ) (අ) සභාව විසින් (ආ) ඡේදය යටතේ තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයක් නොඉක්මවන වාර්ෂික වටිනාකමක් ඇති සියලු නේවාසික ස්ථාන සභාව විසින්, අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව වරිපනම් ගෙවීමෙන් නිදහස් කළ හැකි ය.

(ආ) නිදහස් කරනු ලැබිය හැකි නේවාසික ස්ථානවල වාර්ෂික වටිනාකමේ ප්‍රමාණය තීරණය කිරීමේ දී සභාව විසින්—

(i) සභාව පිහිටුවා ඇත්තේ යම් නගරයක ද එම නගරයේ සංවර්ධන මට්ටම;

(ii) වඩා අඩු වාර්ෂික වටිනාකමක් ඇති නේවාසික ස්ථානවලට සභාව මගින් සලසන ලද සේවාවල හා පහසුකම්වල ස්වභාවය;

(iii) යම් නිදහස් කිරීමක් දීමේ හේතුවෙන් සිදුවිය හැකි ආදායම අඩුවීම හා ඒ අඩුව පියවා ගැනීම සඳහා සභාව විසින් යෝජනා කරනු ලබන ක්‍රියා මාර්ග

සැලකිල්ලට ගත යුතු ය.

(ඇ) (අා) ඡේදයේ විධිවිධාන යටතේ යම් නේවාසික ස්ථානයක් නිදහස් කරනු ලැබූ විට එකී නිදහස් කරනු ලැබීමේ වාසිය එහි පදිංචිකරුට උපචිත විය යුතු ය.".

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 කි. (විදේශීය) රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය. මුදල් ගෙවූ දිනට කලින් නිකුත් කරන ලද පනත් කෙටුම්පත් සහ කිසි නොසැලකීමේ කොන්දේසිය මත ප්‍රමාද දායක මුදල් භාරගනු ලැබේ.